# සිතුවිල්ලක් විලසින් මා

1. සිතුවිල්ලක් විලසින් මා හද තෙරපෙනවා
සතුටු සිනා ලෙස මා මුව සිනහ නගනවා
කඳුලැලක් විලසින් මා නෙත සෝදනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ලංවෙනවා

ජේසුනී මගේ හදටම ඔබ ලංවෙනවා
සිනහ වෙයි කඳුළු බිඳුවෙහි සැඟවී එනවා//

2. ගීතිකා ලෙසින් මා හද තුළ කොඳුරනවා
වේදනා තුළින් ඔබගෙන් මතක මවනවා
පාළුවේ නිසංසල බව ඔබ කැඳවනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ලංවෙනවා

ජේසුනී මගේ හදටම ඔබ ලංවෙනවා
සිනහ වෙයි කඳුළු බිඳුවෙහි සැඟවී එනවා//

3. පහනක් ලෙස අඳුරේ මා හා ඇවිදිනවා
තණ්හා උණුසුම හිත තුළ නිවිලා යනවා
සයුරේ අඳුරේ හැංගි ඉන්න හිතෙනවා
කෙලෙසක හෝ මා හදටම ඔබ ලංවෙනවා

ජේසුනී මගේ හදටම ඔබ ලංවෙනවා
සිනහ වෙයි කඳුළු බිඳුවෙහි සැඟවී එනවා//